පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

12 ශ්‍රේණිය

චිත්‍ර කලාව - I

51 | S | I

කාලය පැය තුනයි

නම:- ..........................................................................................................

විභාග අංකය:- ..........................................................................................

උපදෙස් : මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විතය.

**I කොටස**

-ප්‍රශ්න සියල්ලටම පිලිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.

-එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිලිතුර තෝරා එහි ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.

**II කොටස**

-අනුකොටස් තුනකින් සමන්විතය.

-එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න තුනකට පිලිතුරු සපයන්න. I කොටසට හා II කොටසට අයත් පිලිතුරු පත් එකට භාර දෙන්න.

- ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් එක් එක් ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

(01) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික චිත්‍ර හා කුරුටු ගාන ලද රූප විවිධ පළාත්වල පිහිටා තිබෙන ස්වභාවි ගල්ලෙන් සහ ගුහා ආවරණ තුළින් හමුවී ඇත. මේවා හැඳින්වෙන්නේ,
1. ප්‍රාථමික මානව අභ්‍යාස වශයෙන් ය.
2. මූලික මානව චිත්‍ර ලෙසය.
3. පර්වත චිත්‍ර/ සෙල්සිතුවම් ලෙසය.
4. සෙල්මුවා නිර්මාණ ලෙසය.
5. පර්වත බිත්ති මත කැණීම් කළ චිත්‍ර ලෙසය. (..........)

(02) අනුරාධපුර යුගයේ දී ලෞකික හා ආගමික තේමා මුල්කරගත් චිත්‍ර කලාවක් පැවති බවට සාධ වන්නේ,
1. සීගිරිය, මහා විහාරය සහ තිවංක සිතුවමය.
2. මිහින්තලයේ ධාතුගර්භ චිත්‍ර , වෙස්සගිරිය , ගොනාගොල්ල සහ සීගිරි සිතුවම් ය.
3. මිහින්තලේ ධාතු ගර්භයේ චිත්‍ර , පොලොන්නරුව ගල්විහාර හා තිවංක පිළිම ගෙය සිතුවමය.
4. වෙස්සගිරිය ගොනාගොල්ල හා තන්තිරිමලේ සිතුවමය.
5. හිඳගල ලෙන් සිතුවම් , ඉසුරුමුණිය විහාරය හා සීගිරි සිතුවම් ය. (..........)

(03) 13 වැනි සියවසින් පසු වනගතව තිබූ තිවංක පිළිමගෙයි දහනවවන සියවසේ දී ප්‍රථම වරට කැණීම් ආරම්භ කළ අතර වර්ෂ 1886 දී මෙහි සිතුවම් දිය සායම් මාධ්‍යයෙන් පිටපත් කරන ලද්දේ,
1. A.මරේ යන අය විසින් ය
2. S.M.බාරෝෂ් විසින් ය.

3. පර්සි බ්‍රවුන්ස් විසින් ය.
4. හොකාඩ් විසින් ය.
5. ලුසියානෝ මරන්සි විසින් ය. (..........)

(04) වීර කාව්‍ය හා සාහිත්‍ය කෘතීන් වස්තු විෂය කරගෙන ඉන්දීය පැරණි ශ්‍රී විභූතිය යළි මතුකර දැක්වෙන සිතුවම් නිර්මාණය කළ ඉන්දීය චිත්‍ර ශිල්පියා වන්නේ,
1. අබනීන්ද්‍රනාත් තාගෝර් ය.
2. නන්දලාල් බොෂ් ය.
3. ජෙමිනි රෝයිය.
4. අම්රිතා ෂර්ගිල් ය.
5. රාජා රවිවර්මා ය. (..........)

(05) බටහිර ශාස්ත්‍රාලීය කලාවේ ස්වභාවිකවාදී චිත්‍ර කලා ලක්ෂණ අනුගමනයෙන් නූතන ශ්‍රී ලාංකීය ආගමික චිත්‍ර නිර්මාණය කළ දේශීය චිත්‍ර ශිල්පියා වන්නේ,
1. ජෝර්ජ් කීට් ය.
2. සෝලියස් මැන්දිස් ය.
3. එම්.සාර්ලිස් ය.
4. ඩේවිඩ් පේන්ටර් ය.
5. සෝමබන්දු විද්‍යාපති ය. (..........)

- ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු A, B, C, D, E, F යන රූප සටහන් ඇසුරින් තෝරන්න.


A


B


C


D


E


F

(06) බෞද්ධ ස්තූප ආශ්‍රිත කැටයම් වන්නේ
1. A,B 2. C,D 3. E,F 4.C,E 5.B,F (..........)

(07) නිශ්චිත පුද්ගලයෙක්, නිශ්චිත සිදුවීමක් හා නිශ්චිත කාලරාමුවක් වඩාත් නිවැරදිව හඳුනාගත හැකි ඊජිප්තු කැටයම් ඵලකයක් වන්නේ,
1. A 2. B 3. C 4. D 5. E (..........)

(08) ස්වභාවිකත්වයෙන් හා නව නිර්මාණශීලීත්වය සහිත ඉන්දු නිම්න මුද්‍රා රූප දෙකක් වන්නේ,

1. A,D 2. A,F 3. A,E 4. A,C 5. A,B (..........)

(09) මුද්‍රාවක් සඳහාත්, ස්ථම්භ ශීර්ෂයක් සඳහාත් ස්වභාවික ලක්ෂණ සහිත සත්ත්ව රූපයක් යොදාගත් රූප සටහන් යුගල වන්නේ,

1. A,C 2. A,D 3. D,F 4. D,E 5. A,F (..........)

(10) බෞද්ධාගමික කැටයම් නිර්මාණ තුනක් වන්නේ,

1. B,D,F 2. A,E,F 3. C,D,E 4. B,E,F 5. A,C,E (..........)

- ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් ගැළපෙන පිළිතුර G, H, I, J, K ලෙස නම් කර ඇති පහත සඳහන් රූප සටහන් ඇසුරින් තෝරන්න.



G



H



I



J



K

(11) හින්දු පුරාණෝක්තියක එන සිදුවීමක් පදනම් කරගෙන නන්දලාල් බොෂ් නම් ඉන්දීය ශිල්පියා විසින් නිර්මාණය කළ සිතුවම,

1. G 2. H 3. I 4. J 5. K (..........)

(12) ක්‍රිස්තියානි චිත්‍ර කලාව නව මඟකට යොමු කළ ලාංකීය ශිල්පියෙකුගේ නිර්මාණය වන්නේ,

1. G 2. H 3. I 4. J 5. K (..........)

(13) ශාස්ත්‍රාලීය යථාර්ථවාදී කලා ශෛලීප්‍රයෝග වලින් දුරස්ථව නව කලා ප්‍රවේශයක් හඳුන්වාදුන් නියම යුරෝපීය උපස්ථිතිවාදියාගේ නිර්මාණයක් වන්නේ

1. G 2. H 3. I 4. J 5. K (..........)

(14) යුරෝපීය චිත්‍ර කලා ඉතිහාසයට ආදර්ශයක් සැපයූ, කාන්තාව වටා ගොනු වූ ගෘහස්ථ ජීවිතය චිත්‍රයට නැගූ ඇමරිකානු ජාතික චිත්‍ර ශිල්පිනියකගේ නිර්මාණය වන්නේ,

1. G 2. H 3. I 4. J 5. K (..........)

(15) නල්ලූර් සට්ටනාදර් කෝවිලේ දක්නට ලැබෙන "පලනියාණ්ඩවර්" සිතුවමේ කොටසක් වන්නේ,

1. G 2. H 3. I 4. J 5. K (..........)

- ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට වඩාත් යෝග්‍ය පිළිතුර L, M, N, O, P යන අක්ෂර වලින් නම් කර ඇති රූප සටහන් ඇසුරින් තෝරන්න.



L



M



N



O



P

(16) L අක්ෂරයෙන් දැක්වෙන අශ්ව හිස පිළිබඳ සෙනරත් පරණවිතාන මහතා දක්වන අදහස,

1. වර්ෂාවට අධිපති “පර්ජන්‍ය” සංකේතවත් කරන බවයි.
2. විදුලිය වන “අග්නි” සංකේතවත් කරන බවයි.
3. යුද සෙබළෙකුගේ අශ්වයා සංකේතවත් කරන බවයි.
4. ඍෂිවරයකු නිරූපණය කරන බවයි.
5. සාලිය කුමාරයා සහ අශ්වයා සංකේතවත් කරන බවයි. (..........)

(17) M අක්ෂරයෙන් දැක්වෙන්නේ,

1. ඉපැරණි ඉන්දීය ස්තූප කැටයමකි.
2. භාරුත් ස්තූප සැලැස්මයි.
3. සාංචි ස්තූපයේ සැලැස්මයි.
4. අමරාවතී චෛත්‍ය පුවරු කැටයමයි.
5. හින්දු ආගමික චෛත්‍ය පුවරු කැටයමයි. (..........)

(18) N අක්ෂරයෙන් දැක්වෙන්නේ,

1. සාරානාත් ස්ථම්භ ශීර්ෂය දරා ඇති වෘත්තාකාර වේදිකාව වටා කැටයම් කර ඇති අශ්ව රූපයයි.
2. ලෞරියා නන්දගර් ස්ථම්භ ශීර්ෂය දරා ඇති වෘත්තාකාර වේදිකාව වටා කැටයම් කර ඇති අශ්ව රූපය යි.
3. බයිරා ස්ථම්භයේ කැටයමකි.
4. සාංචි ස්ථම්භයේ අන්තර්ගත කැටයමකි.
5. රාම්පූර්වා ස්ථම්භයේ අන්තර්ගත කැටයමකි. (..........)

(19) කුෂාණ වංශිකයන් අතින් නිම වූ කලා නිර්මාණ අතර බුද්ධ රූපයක් මානව ආකාරයෙන් නිර්මාණය කිරීම සුවිශේෂ කටයුත්තකි. O අක්ෂරයෙන් දැක්වෙන්නේ,

1. මෞර්ය වංශික අශෝක විසින් නිර්මාණය කරවූ කාසියකි.
2. මෞර්ය වංශික චන්ද්‍රගුප්ත විසින් නිර්මාණය කරවූ ඵලකයකි.
3. කුෂාණ වංශික ඇලෙක්සැන්ඩර් විසින් නිර්මාණය කරවූ කැටයමකි.
4. මෞර්ය අධිරාජයා විසින් නිර්මාණය කරවූ ඵලකයකි.

5. කුෂාණ වංශික කණිෂ්ක රජු විසින් කරවූ රන්කාසිය යි. (..........)

(20) P අක්ෂරයෙන් දැක්වෙන්නේ,

1. ලක්සෝර් දේවස්ථානයෙන් හමුවන දෙවන රමේසස් රජුගේ යුධ අවස්ථාවක් දැක්වෙන කැටයමකි.
2. ලක්සෝර් දේවස්ථානයෙන් හමුවන අමෙන් හොටෙප් රජුගේ යුධ අවස්ථාවකි.
3. කානැක් දේවස්ථානයෙන් හමුවන අමෙන් හොටෙප් රජුගේ යුධ අවස්ථාවයි.
4. එඩ්ෆු දේවස්ථානයෙන් හමුවන දෙවන රම්සෙස් රජුගේ යුධ අවස්ථාවකි.
5. අබුසිම්බල් දේවස්ථානයෙන් හමුවන දෙවන රම්සෙස් රජුගේ යුධ අවස්ථාවකි. (..........)

- ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර Q, R, S, T, U යන අක්ෂර සහිත රූප සටහන් ඇසුරින් තෝරන්න.







Q R S T U

(21) Q අක්ෂරයෙන් දැක්වෙන්නේ,

1. ඊජිප්තු මූර්තියකි.
2. ඊජිප්තුවේ පැරණි රාජධානියට අයත් පාලක රූපයකි.
3. ක්‍රිස්තු පූර්ව 2500ට පමණ අයත් ඉපැරණි මූර්තියකි.
4. ක්‍රිස්තු පූර්ව 2400 දී පමණ නිර්මාණය වූ සක්කාරා නම් සොහොන් ගෙයින් හමුවූ මූර්තියකි.
5. සක්කාරා නම් සොහොන් ගෙයින් හමු වූ ක්‍රිස්තු පූර්ව 2400ට පමණ අයත් ස්ක්‍රයිබ් නම් මූර්තියයි. (........)

(22) R අක්ෂරයෙන් දැක්වෙන්නේ,

1. තාරා දෙවගන නම් ලෝකඩ මූර්තිය යි.
2. වටුක බහිරව නම් ලෝකඩ මූර්තිය යි.
3. අර්ධනාරීශ්වර නම් අභයගිරිය කැණීම්වලින් හමුවූ ලෝකඩ මූර්තිය යි.
4. නටරාජා නම් අභයගිරිය කැණීම්වලින් හමුවූ ලෝකඩ මූර්තියයි.
5. චන්දිකේෂ්වර නම් පිත්තල මාධ්‍යයෙන් නිමකල මූර්තිය යි. (..........)

(23) S අක්ෂරයෙන් දැක්වෙන්නේ,

1. හෙල්ල විසිකරන්නා නම් වූ මිසර මූර්තියකි.
2. ප්‍රැක්ටිටෙලස් නම් ශිල්පියාගේ හෙල්ල විසිකරන්නා නම් වූ ග්‍රීක මූර්තියයි.
3. කවපෙත්ත විසි කිරීමට සැරසෙන ග්‍රීක මූර්තියකි.
4. පොලික්ලීටස් නම් ග්‍රීක මූර්ති ශිල්පියා විසින් නිම කළ ඩොරිපෝරස් නම් ලෝකඩ මූර්තිය යි.
5. ෆීඩියස් නම් ශිල්පියා විසින් නිම කළ ඩොරිපෝරස් නම් ලෝකඩ මූර්තිය යි. (..........)

(24) T අක්ෂරයෙන් පිළිබිඹු වන්නේ,

1. නාරිදේහයේ ලාලිත්‍ය මනාව මූර්තිමත් කළ මොහෙන්දොජාරෝවෙන් හමුවූ ලෝකඩ නළඟන රූපය යි.

2. ඝන ලෝහ වාත්තු කිරීමේ ක්‍රමය මනාව ප්‍රකට කරන නළඟන රූපයයි.
3. වත්මන් නවදිල්ලි කෞතුකාගාරයේ තැන්පත් කර ඇති ලෝහ මූර්තියකි.
4. රිදී මාධ්‍ය භාවිතයෙන් වාත්තු කරන ලද නළඟන රූපයකි.
5. හරප්පා ප්‍රදේශයෙන් හමු වූ නළඟන නම් ලෝකඩ මූර්තිය යි. (..........)

(25)කිරි ගරුඬ මාධ්‍යයෙන් නිම කළ මූර්තියක් U අක්ෂරයෙන් දැක්වෙන අතර මෙම මූර්තිය,
1. මයිකල් ආන්ජලෝ නම් ශිල්පියා විසින් නිම කරන ලද ඩේවිඩ් නම් වේ.
2. මයිකල් ආන්ජලෝ නම් ශිල්පියා විසින් නිම කරන ලද කැරලිකාර වහලා නම් වේ.
3. මයිකල් ආන්ජලෝ නම් ශිල්පියා විසින් නිම කරන ලද මියැදෙන වහලා නම් වේ.
4. මයිකල් ආන්ජලෝ නම් ශිල්පියා විසින් නිම කරන ලද මෝසස් නම් වේ.
5. මයිකල් ආන්ජලෝ නම් ශිල්පියා විසින් නිම කරන ලද සියුස් දෙවියා නම් වේ. (..........)

- ප්‍රශ්න අංක 26 සිට 30 තෙක් ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(26) මුද්‍රණයට සුදුසු චිත්ත මෝස්තරයක් නිර්මාණය කිරීමේදී වඩා සැලකිලිමත් විය යුත්තේ,
1. මෝස්තර නිර්මාණයට ගන්නා හැඩතල සහ වර්ණ පිළිබඳවයි.
2. නිර්මාණාත්මක හැඩ සහ ආකර්ෂණීය වර්ණ පිළිබඳවයි.
3. සරල හැඩ සහ බහු වර්ණ භාවිතය පිළිබඳවයි.
4. තලය පුරා එක් දිශාවකට ඒකාකාරීව විහිදී යන හැඩතල පිළිබඳවයි.
5. නිර්මාණය කරන ලද මෝස්තර කොටස සිව් දිශාවටම සම්බන්ධ කරගත හැකි ආකාරයක් ගැනීමයි. (....)

(27)කලා නිර්මාණයක දෘශ්‍ය මූලිකාංග සමූහය විධිමත්ව , තාර්කික සම්බන්ධතාවයක් සහිතව බෙදීයාම "සමබරතාවය" යනුවෙන් විස්තර කෙරේ. මේ අනුව සමබරතාවයට අදාල දෘශ්‍ය මූලිකාංග වන්නේ,
1. ගෝලය, කේතුව සහ ඝනකාභයයි.
2. දිග ,පළල සහ දුරයි.
3. රේඛා ,හැඩ සහ වර්ණයි.
4. සිරස්, තිරස් සහ වක්‍ර රේඛා ය.
5. නිල්, රතු සහ කහ වර්ණයි. (..........)

(28)බ්‍රිතාන්‍ය ශාස්ත්‍රාලයීය යථාර්ථවාදය ගුරුකොට ගෙන ලංකා කලා සංගමයේ ශිල්පීන් කිහිප දෙනෙකු චිත්‍ර නිර්මාණයට නැඹුරු විය. එලෙස ගොඩනැඟුණු ශිල්පීන් දෙදෙනකු හා ඔවුන්ගේ නිර්මාණ නිවැරදිව දක්වා ඇත්තේ,

1.මුදලිඳු A.C.G.S. අමරසේකර- විරැකියාව
J.D.A පෙරේරා - නළඟන

2.මුදලිඳු A.C.G.S. අමරසේකර- යකදුරු දියණිය
ටියුඩර් රාජපක්ෂ- පූස් පැටවා

3.J.D.A.පෙරේරා -විරැකියාව
ටියුඩර් රාජපක්ෂ- කොළ පාට සාරිය

4.J.D.A.පෙරේරා- යකදුරු දියණිය
ඩේවිඩ් පේන්ටර් -යහපත් සමරිතානුවා

5.ඩේවිඩ් පේන්ටර්- ජයග්‍රාහි ජෙරුසෙලම
ටියුඩර් රාජපක්ෂ- විරැකියාව (..........)

(29) පෝල් ගොගැන් සහ වින්සන්ට් වැන්ගෝ යන චිත්‍ර ශිල්පීන් දෙදෙනා ඔවුන්ටම ආවේණික අපේක්ෂාවන් වෙනුවෙන් කලාත්මක උපක්‍රමයන් දෙදෙනාට ගැලපෙන අයුරින් භාවිතයට ගෙන ඇත. මෙම ප්‍රකාශය සනාථ කිරීමට වඩාත් නිවැරදි වන්නේ,

1. වින්සන්ට් වැන්ගෝ වර්ණ ත්‍රීව්‍රතාවය උපයෝගීත්වයෙන් මානව චිත්ත අභ්‍යන්තරික ස්වරූපය ප්‍රකාශනාත්මක ලෙස ඉදිරිපත් කළේය. පෝල් ගොගැන් වර්ණවල තීව්‍රතාවය සංකේතාත්මකව ගෙන ප්‍රකාශනයට මනංකල්පිත බවක් එක් කිරීමට උත්සාහ ගෙන ඇත.
2. වින්සන්ට් වැංගෝ වර්ණ ත්‍රීව්‍රතාවය භාවිතයෙන් කලාත්මක පරිසරයක් ඉදිරිපත් කළ අතර පෝල් ගොගැන් වර්ණ ත්‍රීව්‍රතාවය භාවිතයෙන් චිත්‍ර අවකාශ වෙනස් කළේය.
3. සමස්ත චිත්‍ර ජාලයම ඒකාලෝක කිරීම වැන්ගෝගේ ක්‍රියාව වී ඇත. පෝල් ගොගැන් වර්ණ ත්‍රීව්‍රතාවය ගැන පමණක් සැලකිල්ලට දක්වා ඇත.
4. චිත්‍ර අවකාශය හා නිර්මාණ කාලය වෙනස් කිරීමට වින්සන්ට් වැන්ගෝ වෙහෙසී ඇති අතර පෝල් ගොගැන් එකම වර්ණ වල ප්‍රභේද භාවිතයට වෙහෙසී ඇත.
5. වින්සන්ට් වැන්ගෝගේ නිර්මාණ මනෝ අභ්‍යන්තරික ප්‍රශ්න වලින් පිරී ගොස් ඇත. පෝල් ගොගැන් පාරිසරික සුන්දරත්වය ගැන පමණක් වෙහෙසී ඇත.

(..........)

(30) විවිධ වස්තූන් දෙස බහුවිධ කෝණයන්ගෙන් නිරීක්ෂණය කර ඝනිකමය ආකෘති අවධාරණය වන පරිදි නැවත කැන්වසය මත ප්‍රතිනිර්මාණය කිරීම ඝණිකවාදී ලක්ෂණයයි. මෙම කලා ව්‍යාපාරයේ පුරෝගාමී ශිල්පීන් වන්නේ,

1. පෝල් ගොගැන් සහ පෝල් සෙසාන් ය.
2. එඩ්ගා ඩෙගා හා කැමිලි පිසාරෝය.
3. ගුස්ටාවෝ කුර්බේ සහ වීලර් ය .
4. ජෝර්ජ් බ්‍රාක් හා පැබ්ලෝ පිකාසෝ ය.
5. පිකාසෝ සහ පෝල් සේසාන්ය. (..........)

- ප්‍රශ්න අංක 31 සිට 35 තෙක් ලබාදී ඇති V, W, X, Y , Z යන රූප සටහන් උපයෝගී කරගෙන පිළිතුරු සපයන්න.

(31) V අක්ෂරයෙන් දක්වා ඇති ස්තූප සැළැස්ම,

1. අභයගිරිය ස්තූපය දැක්වේ.
2. රුවන්වැලි මහා සෑයට අදාල වේ.
3. ලංකාරාම ස්තූපයට අදාළ වේ.
4. ථූපාරාමය ස්තූපය අදාල වේ.
5. මිරිසවැටිය ස්තූපයට අදාළ වේ. (..........)



V

(32) W අක්ෂරයෙන් දැක්වෙන්නේ,

1. පොළොන්නරු යුගයට අයත් ළිඳකි.
2. පොළොන්නරු යුගයට අයත් පරාක්‍රමබාහු රජු කරවන ලද ළිඳකි.
3. පොළොන්නරුවෙන් හමුවූ පරාක්‍රමබාහු රජු කරවන ලද පොකුණකි.
4. පොළොන්නරුවෙන් හමුවූ නිශ්ශංකමල්ල රජතුමා විසින් කරවන ලද පොකුණකි.
5. පොලොන්නරුවෙන් හමුවූ මහා පැරකුම්බා රජු විසින් කරන ලද ළිඳකි. (..........)



W

(33) X අක්ෂරයෙන් දැක්වෙන්නේ,

1. පැරණි ඉන්දීය ජනයා භාවිතයට ගත් ජල පොකුණකි.
2. මොහෙන්ජොදරොවේ කැණීම් වලින් හමුවූ ස්නානාගාරයකි.
3. හරප්පා කැණීම් වලින් හමුවූ විශාල ජල පොකුණකි.
4. ඉන්දු නිම්න වැසියා ක්‍රීඩා කල පිට්ටනියකි.
6. අපවිත්‍ර ජලය රැස්කල ජල පොකුණකි. (..........)



X

(34) Y අක්ෂරයෙන් පෙන්වා දී ඇත්තේ,

1. කාෆ්රේ (Khefre) පිරමීඩය යි.
2. කුෆු ( khufu) පිරමීඩය යි
3. චියොප් (cheops) පිරමීඩය යි.
4. මිසනේරියන්ස් ( mycerinus) පිරමීඩය යි.
5. මස්ටබාවක භාහිර පෙනුමයි. (..........)



Y

(35) Z අක්ෂරයෙන් දැක්වෙන්නේ,

1. අජන්තා විහාර මන්දිරයක් ය.
2. අජන්තාවේ චෛත්‍ය ශාලාවක සැලැස්මයි.
3. අජන්තාවේ හින්දු දේවස්ථාන සැලැස්මයි.
4. අජන්තාවේ හීනයාන ලෙන් සැලැස්මයි.
5. අජන්තාවේ ජෛනාගමික සැලැස්මයි. (..........)



Z

- ප්‍රශ්න අංක 36 සිට 40 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් ගැළපෙන පිළිතුර පහත චිත්‍රය ඇසුරින් තෝරන්න.



(36) මෙම සිතුවම,

1. ජෝජ් බ්‍රාක්ගේ ගුවර්නිකා නම් වේ.
2. පැබ්ලෝ පිකාසෝගේ ගුවර්නිකා නම් වේ.
3. පෝල් සෙසාන්ගේ විසුරුණු රූප නිර්මාණයකි.
4. අසංවිධිත බව දැක්වෙන ඉතා රළු නිර්මාණයකි.
5. පැබ්ලෝ පිකාසෝගේ අනියතබව දැක්වෙන නිර්මාණයකි. (..........)

(37) මෙම සිතුම් නිර්මාණය කර ඇත්තේ,

1. දියසායම් මාධ්‍යයෙන් කඩදාසි මතයි.
2. ඇක්‍රලික් මාධ්‍යයෙන් කැන්වසය මතය.
3. පැස්ටල් මාධ්‍යයෙන් ඝනකම සහිත පෘෂ්ඨයකයි.
4. තෙල්සායම් මාධ්‍යයෙන් කැන්වසය මතයි.
5. තෙල් සායම්, කඩදාසි කොළ (පත්තර කොළ ) භාවිතයෙන් කැන්වසය මතයි. (..........)

(38) ළ , අළු සහ සුදු වර්ණයන්ගේ සංකලනයෙන් නිමවූ මෙහි ප්‍රධාන කලාත්මක ප්‍රයෝග වන්නේ,

1. මානව සහ සත්ත්ව රූප ස්වභාවික නිරූපණාත්මක භාවයෙන් මිදී වියුක්ත හැඩ හෝ තල බවට හැරවීමත් ,විකෘති කිරීමත්ය.
2. නිරූපණාත්මක හැඩ සහ ඉතා හොඳ සංයුක්ත රූපයන්ය.
3. ප්‍රාථමික නිර්මාණාත්මක අංග සහ සරල වර්ණ භාවිතයයි.
4. මානව සහ සත්ත්ව රූප ඉතා නිදහස්ව තලයේ ගැළපීමයි.
5. ව්‍යාකූල සත්ත්ව රූප හා මානව ඉරියව් එක්කිරීම හා සරල කිරීමයි. (..........)

(39) මෙම සිතුවමේ ගොන් රූපය තුළින් සාම්ප්‍රදායන් දෙකක් විස්තර කෙරෙන අතර එම සම්ප්‍රදායන් දෙ වන්නේ,

1. ස්පාඤ්ඤයේ සාම්ප්‍රදායික ගොන්පොර ක්‍රීඩාව සහ ගොන් සහිත රූප නිරූපිත කැටයමකි.
2. ෆ්‍රැන්සිස්කෝද ගොයාගේ ගොන්පොර චිත්‍රය හා ස්පාඤ්ඤයේ සාම්ප්‍රදායික ගොන්පොර ක්‍රීඩාවයි.
3. ස්පාඤ්ඤයේ සාම්ප්‍රදායික ගොන්පොර ක්‍රීඩාව හා පසුකාලීනව නිර්මිත සිතුවම්ය.
4. ගොන්පොර මූලි කරගෙන ඇඳි සිතුවම් හා මූර්තිය.
5. ගොන්පොර මූලි කරගෙන ඇඳි සිතුවම් සහ කැටයම්ය. (..........)

(40) මෙම සිතුවමේ අශ්ව රූපය හා කඩුව සහිත මිනිස් රූපය තවත් සම්ප්‍රදායන් දෙකක් පිළිබඳ ඉඟිකරන බව පිළිගත් මතයකි. එම සම්ප්‍රදායන් දෙක වන්නේ,

1. බටහිර කලාවේ ප්‍රධාන තේමාවක් වූ අශ්වයා සහ අශ්වාරෝහකයා පිළිබඳව කතාවයි.
2. යුරෝපා කලාවේ ප්‍රධානත්වයක් ගත් අශ්වයා මෙන්ම අශ්ව හිමිකරුවාද පිළිබඳ කතාවයි.
3. යුරෝපීය කලාවේ ප්‍රධාන තේමාවක් වන අශ්වයා සහ වීරයා පිළිබඳ කතාවයි.
4. බටහිර හා පෙරදිග හා සම්බන්ධව ගොඩනැගී ඇති අශ්වයා පිළිබඳ කතාවයි.
5. අපරදිග සම්ප්‍රදායක් වූ ස්වභාවිකත්වය ඉක්මවා යාම සහ නව මන්පෙත් විවර කිරීමයි. (..........)

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

චිත්‍ර කලාව - I

**12 ශ්‍රේණිය**

| 51 | S | I |
|---|---|---|

නම:- ..........................................................................................................

විභාග අංකය:- ...........................................................................................

**II කොටස**

- මෙම කොටස අනු කොටස් තුනකින් සමන්විතය.
- "අ" කොටසින් ප්‍රශ්න දෙකක් හා "ආ" සහ "ඉ" යන කොටස් දෙකෙන් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

**'අ' කොටස**

**(චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)**

01. කන්ද උඩරට මහනුවර යුගයේ සිතුවම් සඳහා පාදක වී ඇත්තේ බෞද්ධ සාහිත්‍ය හා ශ්‍රී ලංකාවේ බෞද්ධ ඉතිහාසය දැක්වෙන සිද්ධි සහ සැරසිලි මූලිකාංගය.

I. බෞද්ධ සාහිත්‍යය කතා සහ ශ්‍රී ලංකාවේ බෞද්ධ ඉතිහාසය දැක්වෙන සිදුවීම් සඳහා උදාහරණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)

II. ලෙන් විහාරස්ථාන හා ටැම්පිට විහාරස්ථාන ඉදිකළ ගෘහ නිර්මාණ සැලැස්ම, සිතුවම්, මූර්ති ,කැටයම් පිළිබඳ උදාහරණ සහිතව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

III. 18 වැනි සියවස මහනුවර රාජධානිය මූලික කොටගෙන නිර්මිත බෞද්ධ සිතුවම් සම්ප්‍රදාය 19වන සියවස අවසන් භාගයේ දී දකුණු වෙරළ තීරය හා බැදී භූමියේ පැවති විහාර සිතුවම් ශෛලිය දකුණු සම්ප්‍රදාය නැතහොත් පහත රට සිතුවම් සම්ප්‍රදාය ලෙස හඳුන්වයි. මෙම සම්ප්‍රදායන් දෙක තුල විශේෂයෙන් හඳුනාගත හැකි සමාන, අසමානතා පිළිබඳ තුලනාත්මක විග්‍රහයක යෙදෙන්න. (ලකුණු 08)

02. බුද්ධ ප්‍රතිමා කලාවේ ආරම්භය පිළිබඳ විද්වතුන් අතර විවිධ මතවාද පවතී. මහාවංශය දක්වන පරිදි ක්‍රිස්තු පූර්ව තුන්වන සියවස මැද භාගයේ සිටම ලංකාවේ බුද්ධ ප්‍රතිමා නිර්මාණය වී ඇත.

උදාහරණ :- දෙවන පැතිස් රජු ක්‍රි.පූ - 250-210 කාලය
ජෙට්ඨතිස්ස රජු ක්‍රි.පූ -273 - 263 කාලය
මහසෙන් රජු ක්‍රි.පූ -31 0- 274 කාලය.

I. අනුරාධපුර යුගයට අයත් පැරණි බුදු පිළිම පිළිබඳව අධ්‍යයනයෙන් තහවුරු කරගෙන ඇති ප්‍රධාන කරුණු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 2යි)

II. ක්‍රිස්තු වර්ෂ 7-8 සියවස් අතර කාලයේ නිර්මිත හිඳි බුද්ධ ප්‍රතිමාවල ක්‍රිස්තුවර්ෂ 5-6 සියවස් වලට වඩා වෙනස් ලක්ෂණ දැක ගත හැකිය. මෙම වර්ෂ කාණ්ඩ අතර නිර්මිත බුද්ධ ප්‍රතිමා **දෙකක්** උදාහරණයට ගෙන ඉහත ප්‍රකාශය තහවුරු කරන්න. (ලකුණු 05)

III. අනුරාධපුර , පොළොන්නරුව , ගම්පොළ සහ මහනුවර රාජධානි කරා රාජ්‍ය බලය ව්‍යාප්තවීමේදී බුද්ධ ප්‍රතිමා නිර්මාණ කලාවේද විශාල වෙනස්කම් රාශියක් සිදුවී ඇත. මාධ්‍ය ,ශිල්ප ක්‍රමය ,සම්ප්‍රදාය/ ශෛලිය යන කරුණු යටතේ මෙය විමසීමට බඳුන් කරන්න. (ලකුණු 08)

03. ශ්‍රී ලාංකීය නූතන චිත්‍ර කලාවේ ප්‍රවේශයන් දෙකකි. පළමුවැන්න - සාම්ප්‍රදායික ශෛලීය ලක්ෂණවලින් වෙනස් වුවද තවදුරටත් සම්ප්‍රදායික තේමා අත් නොහැර සිතුවම් කිරීමයි. දෙවැන්න - සාම්ප්‍රදායික තේමා සහ සාම්ප්‍රදායික සිතුවම් නිර්මාණ ශෛලීය ලක්ෂණ යන දෙකින්ම නිදහස් වීමයි.

I. මෙම කණ්ඩායම් දෙකේ ශිල්පීන් **දෙදෙනෙකු** නම් කරන්න. (ලකුණු 02)

II. ලංකා කලා සංගමයේ පුරෝගාමී ශිල්පීන් තිදෙනෙකු හඳුන්වා ඔවුන්ගේ නිර්මාණවල දැකගත හැකි සුවිශේෂතා පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

III. ශ්‍රී ලාංකීය නූතන ආගමික චිත්‍ර කලාවට යුරෝපීය ශාස්ත්‍රාලයීය චිත්‍ර කලාවේ ස්වභාවිකවාදී කලා ලක්ෂණ ඒ අයුරින්ම භාවිත කළ බෞද්ධ විහාරස්ථාන බොහෝ ප්‍රමාණයක චිත්‍ර ඇඳි ශිල්පියාත්, බෞද්ධ විහාර සිතුවම් පිළිබඳ දෙස් විදෙස් වල ස්වයං අධ්‍යයනයක යෙදී පසුව තමාටම ආවේණික සිතුවම් ශෛලියක් ගොඩනගාගෙන බෞද්ධ විහාරස්ථාන කිහිපයක සිතුවම් ඇඳි ශිල්පියාත් හඳුන්වාදෙමින් ඔවුන්ගේ නිර්මාණවල දැකගත හැකි සමාන, අසමානතා උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 08)

## **'ආ' කොටස**
## **(චිත්‍ර කලාව ඇගැයීම හා රසාස්වාදය - ඉන්දියාව)**

04. මෞර්ය යුගයේ පෝෂණය වූ බෞද්ධ කලාව පසු කාලීනව සමස්ත ඉන්දීය කලාවන් කෙරෙහි බලපෑම් ඇති කළා සේම විදේශීය රටවල කලා කටයුතු සංවර්ධනයටද අති විශිෂ්ට මෙහෙවරක් වී ඇත.

I. මෞර්ය යුගයේ ඇති වූ බෞද්ධ කලාවට සම්බන්ධ ප්‍රධාන බෞද්ධ කලා නිර්මාණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)

II. සාංචි තොරණ ආකෘතිය දළ සැලැස්මක් ඇඳ ඒ පිළිබඳ සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 05)

III. සාංචි තොරණ ආශ්‍රිත ගල් කැටයම් හා භාරුත් ගල්වැට ආශ්‍රිත කැටයම් පිළිබඳ පහත සඳහන් කරුණු යටතේ විග්‍රහයක යෙදෙන්න. තේමාව, ශිල්ප ක්‍රමය සහ සමාන / අසමානතා .(ලකුණු 08)

05. ලෝක කලා උරුමයක් ලෙස නම් කර ඇති භාරතයේ මහා කලාගාරය අජන්තා නම් වේ.

I. අජන්තාවේ ලෙන් 30ක් පමණ හමුවන අතර මෙහි දක්නට ලැබෙන ලෙන් වර්ග **දෙක** නම් කරන්න. (ලකුණු 02)

II. අජන්තා ලෙන් වර්ග දෙකේ දළ සැලසුම් ඇඳ ඒ පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

III. අජන්තාව වඩාත් වැදගත් වන්නේ ගුහා තුළින් හමුවන චිත්තාකර්ෂණීය සිතුවම් නිසාය. අජන්තා ලෙන් 03 ක අන්තර්ගත සිතුවම් පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 08)

## **'ඉ' කොටස**

## **(චිත්‍ර කලාව ඇගැයීම හා රසාස්වාදය – යුරෝපය)**

06. ප්‍රංශය, ස්පාඤ්ඤය , ඕස්ට්‍රේලියාව, උතුරු ,දකුණු ඇමරිකා සහ සිම්බාබ්වේ යන රටවලින් හමුවූ ප්‍රාග් ඓතිහාසික සිතුවම් හා මූර්ති ලෝක මානව කලා ඉතිහාසයේ ප්‍රථම කලා නිර්මාණ ලෙස පිළි ගනී.

I. ප්‍රංශයෙන් හා ස්පාඤ්ඤයෙන් ප්‍රාග් ඓතිහාසික සිතුවම් හමුවන ගුහා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. ආදී මානවයා කුමක් අරමුණු කරගෙන සිතුවම් නිර්මාණයට ලෙන් භාවිත කරාද යන්න පිළිබඳ කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 05)

III. ප්‍රාග් මානවයා සිතුවම් සඳහා තෝරාගත් තේමාව ,ආකෘතිය, ශිල්ප ක්‍රම සහ වර්ණ භාවිතය පිළිබඳ උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 08)

07. ක්‍රිස්තු වර්ෂ 14-16 සියවස්වල ඉතාලිය කේන්ද්‍රීයව ගොඩනැගුණ පුනරුදය අනතුරුව ෆ්ලෝරන්ස් ,මිලානය ,වැනීසිය වැනි නගරවලද ව්‍යාප්ත වූ අතර පසුව අන්රටවලටද ව්‍යාප්ත විය.

I. ඉතාලි පුනරුද යුගය ආරම්භ වීමට හා එතෙක් පැවති නිර්මාණ ශෛලියේ හා ශිල්ප ක්‍රමයන්හි වෙනස්වීමට හේතු වූ කරුණු **දෙකක්** හඳුන්වන්න. (ලකුණු 02)

II. ඉතාලි පුනරුදයේ ශ්‍රේෂ්ඨතම ශිල්පියා වූ ලියනාඩෝ ඩාවින්චිගේ නිර්මාණ වලට පාදක වූ සම්භාවය චිත්‍ර ආකෘතිය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05)

III. මයිකල් ආන්ජිලෝ විසින් සිස්ටයින් දෙව් මැදුරේ සම්භාව්‍ය ආකෘතියෙන් මිදී නිර්මාණය කර ඇති විශාලම ෆ්‍රෙස්කෝ සිතුවම පිළිබඳ විග්‍රහයක යෙදෙන්න. (ලකුණු 08)

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

චිත්‍ර කලාව II

**12 ශ්‍රේණිය**

කාලය පැය තුනයි.

| 51 | S | II |
|---|---|---|

නම:- ..........................................................................................................

විභාග අංකය:- ..........................................................................................

උපදෙස්:

- ඔබේ විභාග අංකය ,ඔබ චිත්‍රය අඳින කඩදාසියේ පිටුපස සඳහන් කරන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට එය වියළී තිබීම වැදගත්ය. තෙතමනය සහිත චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින් එය ඔබට අවාසි විය හැකිය.

<u>ස්වභාවිකත්ව අධ්‍යයනය හා නිශ්චල ද්‍රව්‍ය සම්පින්ඩනය</u>

පහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන ඔබ ඉදිරියේ තබා ඇති පැළෑටිය සහිත ද්‍රව්‍ය සමූහය ඇඳ වර්ණ කරන්න.

- ❖ ඩදාසි තලය අර්ථවත්ව භාවිත කරමින් සම්පින්ඩනය කරන්න.
- ❖ ද්‍රව්‍යවල හා පැළෑටියේ ගති ලක්ෂණ ,මතුපිට ස්වභාවය, පරිමාණය, ඇස් මට්ටම, ත්‍රිමාණ ලක්ෂණ හා පර්යාවලෝකය පිළිබඳ සැලකිලිමත් වන්න.
- ❖ ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන ආකාරයට ඇඳ ඒ මත ආලෝකය හා අඳුර පතිත වී ඇති අයුරු සැලකිල්ලට ගෙන වර්ණ කරන්න.
- ❖ වර්ණ මාධ්‍ය හැසිරවීමේ ශිල්ප ක්‍රම අර්ථවත්ව භාවිත කරන්න.
- ❖ ද්‍රව්‍ය සමූහයට ගැලපෙන වර්ණවත් පසුබිමක් යොදන්න.
- ❖ ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ලේ පරිමාණය වෙනස් කරගත හැකියි.
- ❖ දියසායම් / පෝස්ටර් සායම් /තුඹු සායම් /පැස්ටල් හෝ මිශ්‍ර මාධ්‍ය ලෙස වර්ණ භාවිත ළ හැකිය.

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

**12 ශ්‍රේණිය**

**චිත්‍ර කලාව-III**

**කාලය පැය තුනයි**

| 51 | S | III |
|---|---|---|

නම:- ........................................................................................................

විභාග අංකය:- ........................................................................................

උපදෙස්:

- පහත සඳහන් 'අ' , 'ආ' සහ 'ඉ' යන කොටස් තුනෙන් එක් කොටසක් තෝරාගන්න. එම කොටසේ එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණවත් චිත්‍රයක් නිර්මාණය කරන්න.
- ඔබේ විභාග අංකය සහ තෝරාගත් ප්‍රශ්න අංකය චිත්‍රය අදින කොලයේ පසුපිට පැහැදිලිව සඳහන් කරන්න.
- චිත්‍රය භාරදෙන විට එය හොඳින් වියළී තිබීම ඉතා වැදගත්ය.
- ඕනෑම වර්ණ මාධ්‍යයක් හෝ මාධ්‍ය කිහිපයක් හෝ මිශ්‍රව භාවිත කළ හැකිය.

## 'අ' කොටස- චිත්‍ර සංරචනය

- පහත සඳහන් මාතෘකාවලින් එකක් පමණක් තෝරා ගන්න.

1. වැව්වාන් දමන මොහොතක වාන් ජලයේ ප්‍රීතියෙන් දිය නාන පිරිසක්.
2. නාගරික පරිසරයක ජනාකීර්ණ වීදියක්.
3. ආගමික උත්සවයක ඔබ සිත් ගත් අවස්ථාවක්.
4. මල් , එල පිරි වනාන්තරයක ගැවසෙන සතුන්.

## 'ආ' කොටස- මෝස්තර නිර්මාණය

- පහත සඳහන් මාතෘකාවලින් එකක් පමණක් තෝරා ගන්න.

5. ස්වභාවික මල්, කොළ ,එල නව නිර්මාණාත්මක අංග බවට පරිවර්තනය කරගෙන ඒවා ඇසුරින් ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කරන්න.
6. සාම්ප්‍රදායික සත්ත්ව මෝස්තර ඒ   කයක් ඇසුරින් දොර රෙද්දක් සඳහා සුදුසු නිර්මාණයක් රන්න.

7. විෂ්කම්භය අඩි 04පමණ වන වෘත්තාකාර මේස රෙද්දක් සඳහා සුදුසු නිර්මාණයක් කරන්න.
8. මැටි මාධ්‍යයෙන් නිර්මාණය කිරීමට යන මල් බඳුනක් සඳහා සුදුසු සැලසුමක් ඇඳ එයට මෝස්තර එක් කරන්න.

**<u>'ඉ' කොටස- ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය</u>**

- පහත සඳහන් මාතෘකාවලින් එකක් පමණක් තෝරා ගන්න.

9. අපේ සංස්කෘතික උරුමය යන තේමාවෙන් යුත් පොතකට සුදුසු පිටකවරයක් සැලසුම් රන්න.( රූ රටා සහ අක්ෂර සහිතව)
10. "ආර්ථික පුනරුදයක් ඇති කර රට ස්වයංපෝෂිත කරමු". යන තේමාව යටතේ විචිත්‍රවත් අර්ථවත් පෝස්ටරයක් අඳින්න.
11. වෙළඳපොළට හඳුන්වා දෙන නව සබන් වර්ගයක් ප්‍රචාරණය සඳහා සුදුසු වෙළඳ දැන්වීමක් නිර්මාණය කරන්න.(රූප අක්ෂර සහිතව)
12. ාලීන ජනතාවට මුහුණ දීමට සිදුවී පවතින ගැටලුවක් විග්‍රහවන පරිදි පුවත්පතක මුද්‍රණයට සුදුසු සරළ කාටූන් චිත්‍රයක් නිර්මාණය කරන්න.

# LOL.lk BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

**ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න**






| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**